## කොණ්ඩේ කපන්න ගිය වෙලාවේ දුටු සිදුවීමකි



***බුද්ධි ප්‍රසාද් වත්පොතේ කළ සටහනක් මේ. ලංකාවේ දැන් තත්වය විදහාපානා අපූරු කතාවක් නිසා උපුටා ගත්තෙමි.***

පන්ති යන ගෑණු ළමයින් පිරිසක් පන්ති යාම ට කලියෙන් කොණ්ඩෙ පාට කර ගන්න ඇවිල්ලෝ ය. එයින් පිරිසක් අපේ පැත්තේ ලූ. අනිත් කට්ටිය මේ ගොල්ල පාට කරගෙන පන්ති එනවා දැක ආසාවට ආ අයයි. කො- ණ්ඩෙ පාට කරන්න සැලූන් එකෙන් රු.300/* ගනියි. පාට මකා නැවත කලූ කරන්න 400/* යි. ගෑණු ළමෝ පන්ති යාමට කලින් සැලූන් පැමිණ කොණ්ඩෙ පාට කරගෙන, පංති හමාර වී නැවත පැමිණ පාට අයින් කරගෙන ගෙවල් බලා පිටත් ව යති. මේවා ඔහොම කෙරීගෙන යද්දී සැලූන් මල්ලී මට මෙහෙම කීවේය.

"මේ ඉස්කෝල කෙල්ලෝ හන්දා හරි කරදරේ අයියා. සල්ලි හම්බෙනවා තමා, එත් කොයි වෙලේ හරි උන්ගේ අම්මලා මෙතෙන්ට හො- යාගෙන එයි....?"

මම මොකවත් නොකියා උගුර පාදා නිකන් සිටියෙමි.

හොඳම සිද්දිය එය නොවෙයි. එතන සිටි එක් ළමයෙක් තමන්ගේ කොණ්ඩයට තවත් මොනා- දෝ කරන්න කියා සැලූන් මල්ලීට කරදර කරයි. ඔහු බෑ කියා මෙසේද කියයි.

"වැඩේට 4000/ක් යනවා. කරගන්නම ඕන්නං අම්මිත් එකක් හෙට උදේම එන්ඩ...."

"අම්මා ඊයේ ගියා... ලබන සතියේ ලංකාවට එන්නේ...."

"එහෙනම් අම්මට කෝල් එකක් දෙන්න කියන්ඩ මගේ නම්බර් එකට...."

"පිස්සුද අම්ම කැමති වෙන්නේ නෑ...."

"එහෙනං නිකංඉන්නවා මට කරදර නොකර.."

ඒත් අර ළමයාගේ අකෂෝඇඩියාව ඉවර වූයේ නැත. බේරෙන්න බැරිම තැන සැලෝන් මල්ලී දෙදෙනාටම සාධාරණ අමුතුම ව්‍යාපාරික මට්ටමේ යෝජනාවක් ගෙනාවේය.

"එහෙනම් මෙහෙම කරන්ඩ.... ඔයා නංගි කාව හරි දම්මලා ඔයාගෙ අම්මා විදියහට මට කෝල් කරවන්ඩ... එතකොට මම ඒ ඔයාගෙ අම්මා කියලා රැවටෙන්නම්. මම රැවටුනා කියලා ඔයාට තේරුණොත් හෙට උදේම මම කියපු ක්‍රීම් ටිකත් අරගෙන එන්ඩ.... හැබැයි මම කෝල් එක රෙකෝඩ් කරනවා..... කවුරු හරි මෙතෙන්ට ඇවිල්ලා කොකු දැම්මොත් මම රෙකෝඩ් කරපු එක පෙන්නනනවා.... කැමති ද?"

## මෙතරම් සතුටක් තවත් වෙද?



සති කීපයකට ඉස්සෙල්ල බණ ගෙදරකට ගිය වෙලාවෙ හමුවුණ සන්නස පාඨකයෙක් කීව කතාවක් මෙහි සටහන් කරන්න කැමතියි.

"හමුවෙන්න බලාගෙන හිටියෙ මේ කතාව ඔයාට කියන්න.." ඔහු කිව්වා. ".. ඔයාලගෙ පත්තරෙන් කෙරන සේවාව ඉතා විශාලයි.. සමහරවිට මං මේ දැන් කියන්න යන දේ ඔයාල දන්නෙවත් නැතුව ඇති.. මතකද මෙයිට මාස ගාණකට කලින් සන්නසේ පළවුණා ලංකාවෙ විශ්ව විද්‍යාලයක උසස් අධ්‍යාපනය ලබන දුවෙකුට එයාගෙල ආර්ථික දුෂ්කරතා වලින් ගොඩ එන්න  ආධාර කරන්න කියලා.. අපි කීප දෙනෙක් එකතුවෙලා ඒ දුවට ආධාර කරන වැඩ පිළිවෙලක් හැදුවා.. අපි මුලින්ම එයාගෙ ගේ බේරලා දුන්නා. ඒ ගේ උගස් තියලයි තිබුණෙ. උගසට සින්න වෙන්න ඔන්න මෙන්න කියලා තිබණෙ"

මගේ හිතට ඇති වුණේ පුදුම සතුටක්. ඔහු තව දුරටත් කතාව කරගෙන ගියා.

"ඉන්පස්සෙ අපි ඒ දුවට ඉගෙනීම කරගෙන යන්න මාස්පතා මුදලක් යවන්න ලෑස්ති කළා. දැන් ඒ දුව කිසිම කරදරයක් නැතිව ඉගෙන ගන්නවා. එයා ඉකොන් ස්පෙෂල් ඩිග්රී එකක් කරන්නෙ" ඔහු කිව්වෙ ලොකු සතුටකින්.

අපි සන්නස කරන්නෙ මහත් දුක් මහන්සියෙන්.

ඒ සියලු දුක් මහන්සි දුරින් දුරුවෙලා යන්න මේ වගේ එක කතාවක් ඇති. පසුගිය අවුරුදු ගණනාවක් ඉඳන් අපි වරින් වර මෙවැනි සංවේදී කතා කොපමණ වාරයක් නම් අසා තිබෙනවද? ඒ හැම වතාවකම හිතට ආවෙ එකම රක කාරණයක්. මේ අපි විඳින සතුටම ඇති අපේ ජීවිත කාල වලටම.

සන්නස හෙව්වෙ සල්ලි නෙවෙයි. සන්නස හැමදාම හෙව්වෙ මනුස්ස කම්. ඒ මනුස්සකම් මේ විදිහට දැනෙනකොට අපි ඇත්තටම යමක් කර තිබෙනවා නේද කියලා හිතෙනවා.

සතුටුයි හිතවතුනි. තන්හාවෙන් ගොඩ ගහගත් දේ නෙවෙයි දුන් දෙයක් පමණයි ඉතිරි වන්නෙ. තන්හාවෙන් ගොඩ ගහ ගත් සියලුම දේ අපි දවසක දාලා යනවා. ඒත් දුන් දේ අපි අරගෙන යනවා.

කතාබහ
ජගත් ජේ එදිරිසිංහ

# MelMora Night 2015

University of Moratuwa Alumni Association in Victoria had their annual DinnerDance on the 20th June at Springvale City Hall

Photograph by Bluetulips creatives

